PAFFREL
නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය.
சுதந்திரமானதும் நியாயமானதுமான தேர்தல்களுக்கான மக்கள் செயற்பாடு.
PEOPLE'S ACTION FOR FREE & FAIR ELECTIONS

# මාධ්‍ය නිවේදනය

පාර්ලිමේන්තු මැතිවරණය - 2020.08.05

## ඡන්ද පොළේ දී ඡන්දදායකයින්ගේ අනන්‍යතාව තහවුරු කිරීම

2020 වර්ෂයේ අගෝස්තු මස 05 වන දින පැවැත්වීමට නියමිත පාර්ලිමේන්තු මැතිවරණයේ දී ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා ඡන්දදායකයින් විසින් තම අනන්‍යතාව තහවුරු කිරීම අනිවාර්ය අවශ්‍යතාවකි.

ඒ අනුව ඡන්දදායකයින් විසින් සිය ඡන්දය ප්‍රකාශ කිරීමේ දී;

- ජාතික හැඳුනුම්පත
- වලංගු විදේශ ගමන් බලපත්‍රය
- වලංගු රියදුරු බලපත්‍රය
- රාජ්‍ය සේවා විශ්‍රාමික හැඳුනුම්පත
- වැඩිහිටි හැඳුනුම්පත
- පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද පූජ්‍ය/පූජක හැඳුනුම්පත
- 2020 පාර්ලිමේන්තු මැතිවරණය සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තුමේන්තුව විසින් නිකුත් කරනු ලබන "ජාතික හැඳුනුම්පත් තහවුරු කිරීමේ ලිපිය",

යන ලියවිලි අතුරින් එකක් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

ඔබ සතුව ඉහත ලේඛන වලින් එකක් හෝ නොමැති නම් ඔබ අයත් ග්‍රාම නිලධාරීවරයා හෝ වතු අධිකාරිවරයා හමු වී මැතිවරණ කොමිෂන් සභාව නිකුත් කරන තාවකාලික හැඳුනුම්පත ලබා ගැනීමේ හැකියාව පවතී.

ඒ සඳහා මෑතකදී ලබා ගත් කළු සුදු හෝ වර්ණ (පළල සෙ.මී. 2 1/2 හා උස සෙ.මී 3) ප්‍රමාණයේ උඩුකය ඡායාරූප පිටපත් දෙකක් සමග 2020.07.29 දිනට පෙර අදාළ කොට්ඨාසයේ ග්‍රාම නිලධාරීවරයා හෝ වතු අධිකාරිවරයාට භාරදීමට කටයුතු කරන්න.

ඡන්දය ප්‍රකාශ කිරීම ඔබේ අයිතියක් මෙන්ම වගකීමකි. ඒ සඳහා පිළිගත් අනන්‍යතා ලේඛනයක් අවශ්‍ය වේ. ඔබගේ අනන්‍යතාව තහවුරු කිරීමට ඔබ අපොහොසත් වුවහොත් ඔබට ඡන්දය භාවිත කිරීමට නොහැකි වනු ඇත.

අද අදම ක්‍රියාත්මක වන්න, ප්‍රමාද වී පසුතැවිලි නොවන්න.

විධායක අධ්‍යක්ෂක
රෝහණ හෙට්ටිආරච්චි

# No.16, Byrde Place, Off Pamankada Rd, Colombo 06, Sri Lanka.
Tel: (+94) 11 2 558 570 / 11 2 558 571 Fax: (+94) 11 2 558 572
E-Mail: paffrel@sltnet.lk Website: www.paffrel.lk